11

# ගංගාරෝහණ වර්ණනාවේ නිර්මාණාත්මක ලක්‍ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*රමණී, ඩබ්ලිව්.* [1]

මහනුවර පශ්චාත් යුගයේ (ක්‍රි. ව. 1706 - 1815) රචනා වූ අවසාන සිලෝ කාව්‍යය වන්නේ ගංගාරෝහණ වණ්නාවයි. ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ්‍ය අවධියට අයත් වන ක්‍රි.ව. 1806 වර්ෂයේ දී දාවිත් සරම් මුදලි නැමැත්තා විසින් නිල්වලා ගඟෙහි පවත්වන ලද ප්‍රථම ගංගාරෝහණ පූජාව වර්ණනා කිරීම මෙම කාව්‍ය නිර්මාණයේ මූලික නිමිත්ත වී ඇති අතර ඡන්දස් අලංකාර ශබ්දාර්ථ දත් කවි ජනයාගේ සිත් ගැනීම හා සත්පුරුෂ ජනයාගේ ශ්‍රද්ධාව හා සුචරිත ධර්මය වර්ධනය කිරීම කතුවරයාගේ අප්‍රධාන අරමුණු වී ඇත. මෙම කාව්‍ය බන්ධනය දොන් තෝමිස් සමරසේකර දිසානායකයන්ගේ නිර්මාණයක් වන අතර පින්කමේ නාමය මුල් කොට ගනිමින් "ගඟරු වනන" හෙවත් "ගංගාරෝහණ වණ්නාව" නමින් ස්වකීය නිර්මාණය නම් කොට ඇත. මෙම සිලෝ කාව්‍ය ග්‍රන්ථය බොහෝ විචාරකයින්ගේ අවධානයට ලක් වී ඇත්තේ නිර්මාණ ලක්‍ෂණවලින් හීන වූ කාව්‍ය ග්‍රන්ථයක් ලෙසයි. මේ නිසා මෙම කාව්‍ය කෘතියෙහි දක්නට ලැබෙන්නේ හීන වූ ලක්‍ෂණ පමණක් ද? යන්න අධ්‍යයනය කිරීම මාගේ පර්යේෂණ ගැටලුවයි. සාහිත්‍ය කෘතියක සාධනීය මෙන්ම නිෂේධනීය ලක්‍ෂණ විමසා බැලීමේ දී එම කෘතිය රචනා වූ යුගයේ පසුබිම, යුගාවේණික සාහිත්‍ය ලක්‍ෂණ හා ඊට සමකාලීන සෙසු නිර්මාණාදිය පිළිබඳ මනා වූ විනිශ්චයක් තිබිය යුතු ම ය. එහෙයින් කෙතරම් විවාද පැන නැගුණ ද ගංගාරෝහණ කාව්‍ය කෘතියෙහි නිර්මාණාත්මක ලක්‍ෂණ ද පවතින බව ගැඹුරින් අධ්‍යයනය කිරීමේ දී හඳුනා ගත හැකි ය. චිත්ත රූප මැවෙන ලෙස මනහර අවස්ථා නිරූපණය, ශබ්ද රසය ජනනය වන සාර්ථක පද්‍ය නිර්මාණ, රසවත් මෙන් ම අවස්ථාවට උචිත ස්වාධීන කාව්‍ය සංකල්ප, කවි සමයේ එන උක්තීන් උචිත ආකාරයෙන් භාවිත කිරීම ආදි වශයෙන් සාධනීය පැතිකඩක් ද අපට මෙම කාව්‍ය ග්‍රන්ථය විමර්ශනයෙන් හඳුනා ගැනීමට අවකාශය උදාවේ. මෙම පර්යේෂණ කාර්යයේ දී ගංගාරෝහණ වර්ණනාව පද්‍ය කෘතියත් ඒ සඳහා විචාරකයින් දක්වා ඇති අදහස් හා මතවාද සම්බන්ධ ලිපි ලේඛනත් අධ්‍යයනය කෙරිණි. ගංගාරෝහණ වර්ණනාව උසස් කාව්‍යයක් නොවීම කෙරෙහි හුදෙක් නිර්මාණකරුවාගේ අනවබෝධය හෝ කවි පබැඳීමේ ශක්‍යතාව හීනවීම හෝ මතු නොව, සමකාලීන සාහිත්‍යය කෙරෙහි බලපාන ලද යුගාවේණික සාහිත්‍ය ලක්‍ෂණ ද හේතු වී ඇති බව නිගමනය කළ හැකි ය. දුර්වල කාව්‍ය ලක්‍ෂණ සහිත කාව්‍ය පබැඳුමක් ලෙස ප්‍රකට වුවත් ගංගාරෝහණ වර්ණනා කාව්‍ය කෘතියෙන් නිර්මාණාත්මක ලක්‍ෂණ හමුවන බව මෙම පර්යේෂණයෙන් තහවුරු වේ.

ප්‍රමුඛ පදඃ සිලෝ කාව්‍ය , සාධනීය ලක්‍ෂණ , යුගාවේණික සාහිත්‍ය ලක්‍ෂණ , නිෂේධනීය ලක්‍ෂණ, ගංගාරෝහණ වර්ණනාව

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* ramaniwithanage1@gmail.com